www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝ පුරවැසියාඃ තෝමස් පේන්ගේ (1737-1809) ජීවිතය හා ඔහු විසූ යුගය පිළිබඳ කෙටි සමාලෝචනයක්

**Citizen of the world: a brief survey of the life and times of Thomas Paine (1737-1809)**

ඈන් ටැල්බට් විසිනි

**2009 ජූනි 08**

*දීහ අටවන සියවසේ දිවි ගෙවූ විප්ලවවාදියෙකු වන තෝමස් පේන් අභාවයට පත් වී පසුගිය ජූනි 8 වෙනිදාට අවුරුදු 200ක් සපිරුනි. රොදර්හැම් නාගරික දිසාවේ ප්‍රාදේශීය ඉතිහාස මඬුල්ල විසින් සංවිධානය කෙරුනු රොදර්හැම් කලා උළෙලේ අංගයක් ලෙස, 2004 සැප්තැම්බර් 24 දින බ්‍රිතාන්‍යයේ පැවැත්වුනු රැලියකට ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලේඛිකා ඈන් ටැල්බට් විසින් ඉදිරිපත් කෙරුනු පහත දැක්වෙන දේශනය, ඒ නිමිත්තෙන් ලෝසවෙ අඩවියෙහි යලි නොබෝදා පල කෙරින.*

1788 හේමන්තයේ දී රොදර්හැම් හි ඩොන් නදිය හරහා පාලමක් ඉදිකරමින් සිටි පිරිසකි. මෙම ඉදිකිරීම දැක ගැනීම සඳහා නත්තලට පෙර වැල නො කැඩී ඇදී ආ කීර්තිමත් ආගන්තුකයන් සමූහය අනුව පෙනීගියේ මෙය සාමාන්‍ය පාලමක් නො වන බව සහ එහි සැලසුම් නිර්මානකරු සාමාන්‍ය ඉංජිනේරුවකු නො වන බවයි. මෙකී ව්‍යාපෘතිය මෙහෙයවමින් සිටියේ, 1776 නත්තල් දින පැවති ට්‍රෙන්ටන් සංග්‍රාමයට පෙරාතුව වොෂින්ටනයේ සෙබලුන්ට ඇසෙන්නට කියැවූ *Common Sense* and *The American Crisis* 'සිහි බුද්ධිය හා ඇමරිකානු අර්බුදය' නම් කෘතියේ කතුවර තෝමස් පේන් ය.

"මිනිසුන්ගේ ආත්මයන් උර ගා බැලෙන්නේ මෙ වන් කාල පරිච්ඡේදයන් විසිනැ"යි පවසමින් එම කෘතිය ආරම්භ වූයේ ය. "ගිම්හානයේ සොල්දාදුවා ද, සූර්යාලෝකය මැද හුන් දේශප්‍රේමියා ද, මෙම අර්බුදය මධ්‍යයේ සිය රට වෙනුවෙන් කෙරෙන මෙහෙයෙන් හැකිලී යනු ඇත. එහෙත් දැන් එය විඳ දරා සිටින යමෙක් වෙත් ද උහු, ස්ත්‍රී පුරුෂ සැමගේ ආදරය ට ද කෘතඥතාවයට ද නිස්සෝ වෙති. ප්‍රජා පීඩක කෲරත්වය ද නරකාදිය සේ ම පහසුවෙන් ජය ගත නොහැක්කකි. නමුදු අපේ සැනසිල්ලට එක් කරුනක් වෙයි. සටන වඩාත් දුෂ්කර වන තරමට ම විජයග්‍රහනය වඩවඩාත් ඓශ්චර්යමත් වනු ඇත." මේ වොෂිංටනයේ ද, ජෙෆර්සන්ගේ ද මිතුරා වන ටොම් පේන් ය; ලෝක පුරවැසියා වන ටොම් පේන් ය.

ඔහු තනමින් සිටි පාලම ද, එම මිනිසාට වඩා අඩුවෙන් විප්ලවකාරී එකකැයි කිව නොහේ. එය යකඩ පාලමක් විය. 1779 දී යකඩ පාලමක් කෝල්බෘක්ඩේල්හි ඉදි කොට තිබූ අතර ප්‍රන්සයේ ඒ පිලිබඳ සාකච්ඡා වෙමින් පැවැතියේ ය. එහෙත් තවමත් යකඩ පාලම්



තෝමස් පේන් ආලේඛය ඔගස්ට් මිලියෙර්

යනු නව සංකල්පයක් විය. මෙම අලුත් ද්‍රව්‍යයේ සම්පූර්න විභවයෙන් තවමත් ප්‍රයෝජනයට ගෙන තිබුනේ අල්පයක් පමනි.

පවුම් ලක්ෂ දෙකක ප්‍රාග්ධන වටිනාකමක් සහිත වූ රොදර්හැම් හි වෝකර් සමාගමෙන් (ව්‍යාපෘතියට) ලද පිටුබලය ද සමග පේන් ආර්ථික සාර්ථකත්වයේ අද්දරට පැමින ඇති බවක් ද, සමෘද්ධිමත් විශ්‍රාම කාලයක් සඳහා ලක ලැහැස්ති වෙමින් සිටින බවක් ද පෙනෙන්නට තිබිනි. එහෙත් ටොම් පේන් ගේ ආත්මය උර ගා බැලූ කාල පරිච්ඡේදය තවමත් අහවර වී තිබුනේ නැත. අවුරුදු තුනක් තුල පාලම ඉදි කිරීමේ ව්‍යාපෘතිය අත් හැර දමන ලදී. (පාලමේ) අලුත් ම ආකෘතිය ලන්ඩනයේ අවන්හලක අංගනයේ මල බැඳෙමින් තිබින. පේන් යලිත් දේශපාලනයට බැස සිටියේ ය.

අයිලිංටනයේ 'ඒන්ජල් ඉන්' අවන් හලේ මහ රෑ වන තුරු ඉටිපන්දම් එලියෙන් වැඩ කරමින් ඔහු, '*The Rights of Man,* මිනිසාගේ අයිතිවාසිකම්'

කෘතියේ නිමහම් කටයුතු සිදු කරමින් හුන්නේ ය. ප්‍රන්ස විප්ලවය, සමාජ සමානතාව හා මිනිසාගේ සර්ව භෞමික අයිතිවාසිකම් හෙලා දකිමින් එඩ්මන්ඩ් බර්ක් විසින් ලියන ලද *Reflections on the French Revolution* 'ප්‍රන්ස විප්ලවය පිලිබඳ ප්‍රත්‍යවේක්ෂන' නම් කෘතියට එ මගින් පිලිතුරු සපයා තිබුනේ ය. බ්‍රිතාන්‍යයේ ද ඉන් ඔබ්බෙහි ද දේශපාලනයේ හැඩ තල ප්‍රති අර්ථකථනය කිරීමට මේ පොත් යුගලය සමත් විය. එඩ්මන්ඩ් බර්ක් ඔහුගේ පෞද්ගලික මිතුරෙකි. පාලම ඉදි කෙරෙමින් පැවැති කාලයේ එහි කටයුතු බැලීමට මස්බරෝ කරා ගිය විග් පාක්ෂික වැදගතුන් අතර බර්ක් ද වූයේ ය. එහෙත් ප්‍රන්ස විප්ලවය පිලිබඳ ඔවුන්ගේ සංකල්ප එහැම පිටින් ම එකිනෙකට පටහැනි විය.

විවිධ පන්තිවලට අයත් ජනයා කිසියම් අනියතාකාර දේශපාලන ඇදැහීමක් පසුපස ඒකරාශී කෙරුනු විග් පක්ෂයේ පැරැනි සබඳතාවයනට ප්‍රන්සයේ දේශපාලන සිදුවීම්වල හෝ බ්‍රිතාන්‍යයේ සමාජ හා ආර්ථික වර්ධනයන් හි බර දරා ගත නො හැකි විය. පවත්නා දේපල සබඳතාවයනට ප්‍රන්ස විප්ලවය තර්ජනයක් බවට බර්ක් ඉතා නිවැරදි ව දුටුවේ ය. මේ තර්ජනය වූ කලී, ප්‍රන්ස විප්ලවයට ක්ෂනිකව ම සහාය පල කෙරෙමින් කම්කරු ජනයා විසින් ෂෙෆීල්ඩයේ හා ආසන්න නගරයන් හි වීථී මත පවත්වන්නට යෙදුනු පෙලපාලි ලෙස ඉක්මනින් ම ප්‍රකාශයට පත් වීමට නියමිත වූවකි. මේ වසරවල දී බ්‍රිතාන්‍යය බොහෝ දෙනා විසින් හඟිනු ලැබූ තරමට වැඩියෙන් විප්ලවයට ආසන්නව සිටියේ ය. ඉදින් බ්‍රිතාන්‍ය විප්ලවය සාර්ථක වී නම්, ප්‍රගතිශීලී ප්‍රජාතන්ත්‍රවාදී තුන් ජනරජයන් විසින් නූතන ලෝකය ඉතා වෙනස් ආකාරයකින් හැඩ ගැන්වීමට බොහෝ සෙයින් ඉඩ තිබින.


"විප්ලව දෙකක කොටස්කරුවෙකු වීම යනු අරමුනක් සඳහා ජීවත් වීමකැ"යි තෝමස් පේන් 1789 දී ජෝර්ජ් වොෂිංටන් වෙත ලියා යැවී ය. මෙහි දී (විප්ලව) දෙකක් ගැන කථා කිරීම අවතක්සේරුවක් විය හැක. පේන් විප්ලව තුනකට - ඇමරිකානු විප්ලවය, ප්‍රන්ස විප්ලවය හා කාර්මික විප්ලවයට - සහභාගී වූයේ ය. අප ජීවත් වන ලෝකය නිර්මානය කිරීමට ඔහු ආධාර කලේ ය. මෙම දේශනයේ අරමුන, මේ අපූර්ව මිනිසාගේ අඛන්ඩ දේශපාලන මෙහෙවර අනාවරනය කර ගැනීමයි.

ඉදින් තෝමස් පේන් යනු කවරෙක් වී ද?

ඔහුගේ ජීවිත කථාවට අඩංගු හුදු කරුනු සැලැකූ කල, ඒවා සරල ය; ඇතැම් විට කටු සටහනක් පමනට ලුහුඬු ය. 1892 දී පේන්ගේ ජීවිතය පිලිබඳ ප්‍රථම ප්‍රාමානික කෘතිය කල එලි බට තැන් පටන් පල වූ පොත් ගනනාවක ඒවා යලි යලිත් කියැවී ඇත. මොන්කුයර් කොන්වේ විසින් රචිත *The Life of Thomas Paine* 'තෝමස් පේන්ගේ ජීවිතය', ඔහුගේ ජීවිත කථාව පිලිබඳ සම්මත කෘතිය ලෙස පවතී. (වහල් සේවය) අහෝසි කිරීම සඳහා පෙනී සිටියෙකු ද, ඒබ්‍රහම් ලින්කන්ගේ ආධාරකරුවකු ද වූ කොන්වේ, ඇතැම් විස්තාරනයන්හි සාවද්‍යතා තිබුන ද (පේන්ගේ ජීවිතය පිලිබඳ) හිතවාදී වාර්තාකරුවෙක් වූයේ ය. නිව් රොෂෙල් හි පේන්ගේ නිවෙස සංරක්ෂනය කල තෝමස් පේන් ජාතික ඉතිහාස සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ ඔහු ය. වඩා නූතන ප්‍රාගල්භ්‍ය කෘතීන් ඇතැම් විට වඩාත් නිරවද්‍ය විය හැකි නමුදු, ඒවා බොහෝ කොට සාකච්ඡා කොට තිබුනේ පේන්ගේ ජීවිතයේ ඇතැම් පැති - සාමාන්‍යයෙන් ඔහු ඇමරිකාවේ ගෙවූ වසර කිහිපය හෝ ප්‍රන්ස අත්දැකීම් - පිලිබඳ ව පමනෙකි. එහෙත් මේ දෙක ම එක් කොට සාකච්ඡා කෙරී ඇත්තේ කලාතුරකිනි. මේවා අතර වඩාත් සැලකිය යුතු කෘතිය වන්නේ එරික් ෆොනර්ගේ *Tom Paine and Revolutionary America* 'ටොම් පේන් සහ විප්ලවවාදී ඇමරිකාව' කෘතියයි. පේන්ගේ සමස්ත ජීවිතය පිලිබඳ ව සාකච්ඡා කෙරෙන හොඳම මෑත කාලීන අධ්‍යයනය වන්නේ ජෝන් කීන්ගේ *Tom Paine: a political life.* 'ටොම් පේන්: දේශපාලන ජීවිතයක්' නම් කෘතියයි.

පේන්ගේ ජීවිත කථාව මගින් පිලිබිඹු වන්නේ එ තෙක් නොවූ විරූ නව සමාජ මාදිලියක අත්දැකීම් යෑ දුගී පසුබිමකින් පැමින ස්වයං අධ්‍යාපනය ලැබූ මිනිසුන් කර්මාන්ත හා විද්‍යා ක්ෂේත්‍රයනට සහ පේන් සම්බන්ධයෙන් ගත් කල දේශපාලනයට ද අවතීර්න වීම ය. මෙම නව ප්‍රපංචයේ වඩාත් දීප්තිමත් උදාහරනය වූයේ ඔහු ය.

1737 ජනවාරි 29වන දින නැගෙනහිර ඇන්ග්ලියාවේ තෙෆර්ඩ් හි දී උපත ලැබූ ඔහු ක්වේකර්


RIGHTS OF MAN:

ANSWER TO MR. BURKE's ATTACK

ON THE

FRENCH REVOLUTION.

BY

THOMAS PAINE,

LONDON:

මිනිසාගේ අයිතිවාසිකම්

ලබ්ධික (ක්වේකර් යනු අපිස්වාදී ක්‍රිස්තියානු නිකායකි) බොස්තොරොක්කකරුවෙකු වූ ජෝසප් පේන්ගේ හා ඇන්ග්ලිකානු ලබ්ධික ස්ත්‍රියක වූ ෆ්‍රාන්සස් කෝක්ගේ ද පුත්‍රයා වූයේ ය. ළදරු කල ම මියගිය සිය සොහොයුරිය මෙන්ම පේන් ද බොහෝ විට එංගලන්ත සභාවේ භෞතීස්මය ලබන්නට ඇතැයි සිතිය හැක. එහෙත් මේ සම්බන්ධ කිසිත් වාර්තාවක් දැනට ඉතිරි ව නැත. සිය මවගේ ඇන්ග්ලිකානුවාදය හෝ පියාගේ ක්වේකර් විශ්වාසයන් ඔහුට උරුම නො වී ය. එතෙකුදු වුව, ඔහු ඇති දැඩි වූ මුල් යුගයේ ඔහු භාවිත කල භාෂාවේ බයිබලීය දෘඪ භාවයක් දැකිය හැක.

ඔහු අධ්‍යාපනය ලැබුවේ තෙෆර්ඩ් ව්‍යාකරන පාසැලෙනි. නගරයේ නිදහස් පුරවැසියෙකු ලෙස ඔහුගේ පියාට, කොට්ඨාශයෙන් පිටත පදිංචිකරුවන්ගෙන් අය කෙරුනු සිලිං දහයේ ගාස්තුව ගෙවීමෙන් තොර ව සිය පුත්‍රයා ව්‍යාකරන පාසලට යැවීමට හැකි වුවත් ඔහුට අවශ්‍ය කඩදාසි, පිහාටු පෑන් හා තීන්ත මිල දී ගැනීමට මුදල් සපයා ගත යුතු ව තිබිනි. ඒ සඳහා අසීරු අරගලයක නිරත වීමට සිදු විය.

ඔහුගේ පසුබිම සහිත සෙසු දරුවන් රැසක් සේ ම පේන් ද වයස 12 දී අභ්‍යාසලාභියෙකු බවට පත් වීමට සිය පාසැල හැර ගියේ ය. පේන් සම්බන්ධයෙන් ගත් කල එය, සිය පියා යටතේ බොස්තොරෙක්කකරුවෙකු ලෙස ලද පුහුනුවක් විය. මේ වෘත්තිය අප්‍රිය වීම නිසා හෝ , නැතහොත් එය පිරිහී යන කර්මාන්තයක් බැව් වටහා ගෙන සිටි නිසා හෝ සිය නිවෙසින් පිට වූ ඔහු 1756 දී පෞද්ගලික යුද නැවක සේවයට බැඳුනේ ය. වහා ලන්ඩනයට දිව ආ ඔහුගේ පියාට ඉන් ඉවත් වීමට පේන් කැමති කර ගැනීමට හැකි වූයේ වාසනාවට ය. මක්නිසාද යත්, ඔහු තෝරා ගෙන තිබූ "භීෂනය" ලෙස නම් කොට තුබුනු නෞකාව, සිය යාත්‍රාව අතරතුර සතුරු ප්‍රන්ස පෞද්ගලික යුද නැවක් විසින් අල්ලාගන්නා ලදුව එහි කාර්ය මන්ඩලයෙන් දිවි ගලවා ගැනීමට හැකි වූයේ 17කට පමනක් වූ නිසා ය.

කෙටි කලක් ලන්ඩනයේ බොස්තොරොක්කකරුවකු ලෙස වැඩ කල මුත් පේන් ඊලඟ වසරේ, "ප්‍රසියාවේ රජ" ලෙස නම් කොට තිබූ වෙනත් පෞද්ගලික යුද්ධ නෞකාවකට එක් වූයේ ය. මෙ වර පියා ඔහුගේ නැව් නැගීමට හරස් වූයේ නැත. මේ වූ කලි ප්‍රන්සය සමග සත් අවුරුදු යුද්ධය පැවති සමයයි. මාස 6ක ඇවෑමෙන් පේන් සාක්කුවේ පවුම් 30ක් ද සහිතව යලිත් ගොඩ බැස හුන්නේ ය.

දෙ වන චාරිකාවක යෙදෙනු වෙනුවට, ඔහුට මහා ධන නිධානයක් තරම් වන්නට ඇතැයි සිතිය හැකි මෙම මුදල ඔහු යෙදැවූයේ ලන්ඩනයේ දී ප්‍රසිද්ධ දේශනවලට සවන් දෙමින් විද්‍යාව හා දර්ශනවාදය පිලිබඳ අධ්‍යාපනයක් ලබා ගැනීමට ය. සමාජයේ අති මහත් කොටස් විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් බැහැරකෙරී තිබූ සමයෙක බොහෝ දෙනාට උසස් අධ්‍යාපනයක් ලබා ගත හැකි එකම ආකාරය මෙය විය. ඔහු විසින් ම පසු කලෙක පවසන ලද පරිදි, පේන් සම්බන්ධයෙන් ගත් කල මෙය ඔහුගේ මුලු ජීවිතය ම වෙනස් කල අත්දැකීමක් වූයේ ය. ඔහුගේ ජීවිතයේ මෙම කාල පරිච්ඡේදයේ දී ඔහුට දේශපාලනය පිලිබඳ උනන්දුවක් නො තිබිනි. නිල දේශපාලන ලෝකය දූෂිත එකක් වූ අතර එය ඔහුගෙන් දුරස්ථ එකක් විය. ඔහු දේශපාලනය කරා එලැඹි මාවත වූයේ විද්‍යාවයි. ඔහු සම්බන්ධකම් පැවැත්වූ බොහෝ දෙනා උසස් දේශපාලන හා සමාජ අදහස් දැරුවෝ වූහ. එය විශ්වය පිලිබඳව (අධ්‍යයනය කිරීමෙහි ලා) තාර්කික චින්තනය යොදාගැනීමේ සිට එය සමාජ සංවිධානය පිලිබඳව යොදා ගැනීම දක්වා වූ කෙටි පියවරක් විය.

එසේ වුවත් පේන්ට කිසියම් ජීවිකාවෘත්තියක් තිබිය යුතු විය. ඉක්මනින්ම කෙන්ට් හි බොස්තොරොක්කකරුවකු ලෙස ජීවිතය සකසා ගත් ඔහු එම ප්‍රදේශයේ ම තරුනියක හා විවා පත් විය. දරුවකු ප්‍රසූත කිරීමේ දී ඇය මිය ගියා ය. ඉන් වැන්දඹු පවට පත් පේන් බදු එකතු කරන්නෙකු වීමට තීරනය කලේ ය. සිවිල් සේවයේ මේ කනිටු ශාඛාව ස්වකීය රැකියා සුරක්ෂිතතාව සහතික කරනු ඇතැයි ඔහු අපේක්ෂා කල බව නිසැක ය. එහෙත් එය එසේ සිදු නො වින. වසර කිහිපයක ඇවෑමෙන් ඔහු රැකියාවෙන් නෙරපා දමන ලද අතර, බොහෝ විට ඊට හේතු වන්නට ඇත්තේ ජ්‍යෙෂ්ට නිලධාරියෙකුගේ වංචාවකි.

විරැකියාවට පත් පේන් ට තමන් යලි සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා පෙත්සමක් ඉදිරිපත් කිරීමට ලන්ඩනයට යාමට සිදු විය. ඊලඟ වසරේ ඔහු යලිත් සේවයේ පිහිටුවන ලදී. එහෙත් තනතුරක් ලැබෙන තුරු තව දුරටත් බලා සිටින්නට ඔහුට සිදුවිය. ඒ අතරතුර කම්කරුවෙකුගේ වැටුපට වඩා අඩු වැටුපකට උගැන්වීමේ යෙදෙමින් ඔහු ජීවිකාව සපුරා ගත්තේ ය. ලන්ඩනයේ රැඳී සිටීමෙන් ශාස්ත්‍රීය කවයන් සමග යලි මුසු වීමේ අවස්ථාව ඔහුට හිමි විය. ඔහුට මෙසේ හමු වූවන් අතර බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් ද වූයේ ය. එම හමුවීම වූකලී, ඒ මිනිසුන් දෙදෙනාට ම සහ මතු පරම්පරාවන්ට ද බෙහෙවින් ඵලදායී වූ හමුවීමක් විය.

අවසානයේ සසෙක්ස් ප්‍රාන්තයේ ලීව්ස් හි බදු එකතු කරන්නෙකුගේ තනතුරක් ඔහුට හිමි විය. මෙහි දී පරිනත පේන් පිලිබඳ යම් සංඥාවක් ප්‍රථම වරට ඉස්මතු වෙනු දැකිය හැක. යලි විවා පත්ව හුන් ඔහු, බදු රැස් කරන්නන්ට වඩාත් ඉහල වැටුප් ඉල්ලා උද්ඝෝෂනයක් ඇරඹූ අතර ප්‍රාදේශීය දේශපාලනයට ද සම්බන්ධ වූයේ ය.

කොස්තාපල් වරයා ආදී නාගරික නිලධාරීන් තෝරා පත් කර ගන්නා දොලොස් දෙනෙකුගෙන් සමන්විත කමිටුවේ සාමාජිකයෙකු බවට ඔහු පත් විය. තව ද, ප්‍රදේශයේ දුගී සහන වැඩ පිලිවෙලවල්, මාර්ග අලුත්වැඩියාව හා වීථි ආලෝකනය සැපයීම සංවිධානය කරන බදු ගෙවන්නන්ගේ නියෝජිත රැස්වීම්වලට ද ඔහු සහභාගි විය. ලීව්සය වැනීසියක් නො වූ බව සැබෑ ය. එහෙත් ප්‍රත්‍යක්ෂ ලෙස ම සමූහාන්ඩු වර්ගයේ දේශපාලනයක ප්‍රායෝගික පලපුරුද්ද අත්පත් කර දුන් මෙම අත්දැකීම් පේන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

තව ද, වයිට් හාට් හි දී රැස් වී ප්‍රාදේශීය, ජාතික හා අන්තර්ජාතික දේශපාලනය පිලිබඳ ව සාකච්ඡා පවත්වන හා, ඒ අතරවාරයේ බීර සහ ක්වාටින් සෑහෙන ප්‍රමානයක් භුක්තිවිඳින හිතුවක්කාර සමාජයේ ද ඔහු සාමාජිකයෙකු ව සිටියේ ය. බොහෝ විට බ්‍රිතාන්‍යය හා එහි ඇමරිකානු විජිතයන් අතර ගැටුම සම්බන්ධ

කරුනු කාරනා ඔහු විසින් මුලින්ම හැඳින ගන්නට ඇත්තේ එහි දී විය යුතු ය.

ප්‍රාදේශීය පුවත්පතේ කතුවරයා ද මෙම හිතුවක්කාර සමාජයේ එක් සාමාජිකයෙකු විය. බ්‍රිතාන්‍ය රජයට පහර දෙමින් ලියැවුනු ඇමරිකානු පත්‍රිකා යලි සිය පුවත්පතේ පලකල ඔහු ජෝන් විල්ක්ස්ගේ ආධාරකරුවෙකු වූ අතර, 1770 අගෝස්තුවේ දී ලීව්සයට පැමිනි විල්ක්ස් උත්සවාකාරයෙන් පිලිගනු ලැබී ය. රැඩිකල් දේශපාලනය කෙරේ විල්ක්ස්ගේ කැපවීම කෙටි කාලීන එකක් බැව් පසුව සනාථ වූ නමුත්, වරප්‍රසාද ලත්තවුනට හා ප්‍රජා පීඩනයට එරෙහි ජනප්‍රිය දේශපාලන ව්‍යාපාරයක් තුල පේන් ලත් ප්‍රථම අත්දැකීම වූයේ එය යි.


බංකොලොත් භාවයට පත් වීම හා දෙ වන බිරියගෙන් වෙන් වීම විසින් පේන් ලීව්සයේ ගෙවූ කාලය අවසානයකට ගෙන එන ලදී. 1774 දී, ස්ථාවර රැකියාවක් නොමැතිව සිය මැදි වියට එලඹෙමින් හුන් ඔහු, ඔහුට පෙර බොහෝ දෙනා විසින් කරනු ලැබ තුබූ හා ඔහුට පසු බොහෝ දෙනා විසින් ද කරන ලද්දා වූ දෙය කලේ ය. ඔහු ඇමරිකාව බලා යාත්‍රා කලේ ය. කෙසේ වෙතත් සෙසු බොහෝ විගාමිකයන්ට වඩා වැඩි යමක් ඔහු සතු විය. ඔහගේ සාක්කුවේ බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් විසින් දෙන ලද හඳුන්වා දීමේ ලිපියක් තිබින.

පිලඩෙල්ෆියාවේ දී රැකියා විරහිත බදු රැස් කරන්නා නව සඟරාවක කර්තෘ පදවියට පත් ව හිඳිනු දක්නා ලදී. ලීව්සයේ දී ඔහු දේශපාලනයට හඳුන්වා දෙනු ලැබී නම්, මේ පුවත්පත් කලාවට ඔහු හඳුන්වා දීමයි. බ්‍රිතාන්‍යය හා එහි විජිතයන් අතර ගැටුම උච්ඡ ස්ථානයට එලැඹෙමින් තිබිය දී පේන්ගේ පුවත්පත් කලාවේදී වෘත්තීයමය ජීවිතය ආරම්භ විය.

මේ කාල පරිච්ඡේදය තුල පේන් ලියූ ලිපි නිරතුරුව ම පාහේ යටත් විජිත සම්බන්ධ බ්‍රිතාන්‍යයේ ප්‍රතිපත්තිය පිලිබඳ විවේචනාත්මක ඒවා විය. එහෙත් තවමත් ඔහු බ්‍රිතාන්‍යයෙන් නිදහස් වීම වෙනුවෙන් පෙනී සිටියේ නැත. එසේ පෙනී සිටි කිසිවෙකුත් එදා නො සිටි තරම් ය. ඇමරිකානුවන් සිතුවේ තමන් බ්‍රිතාන්‍යයන් බවයි. යටත් විජිත බලධාරීන් තමන්ට සැලකූ අන්දම පිලිබඳව ඔවුන් විරෝධය පලකලේ ඉංග්‍රීසින් ලෙස තමන් සතු අයිතීන් උල්ලංඝනය වෙමින් පවත්නා බැව් සිතූ නිසා ය. එහෙත් 1775 අප්‍රේල් 19 වන දින ලෙක්සිංටන් රැස්වීම් ශාලාවෙන් පිටත දී ඇමරිකානු ආරක්ෂක භට කන්ඩායමකට වෙඩි තබන ලෙස මේජර් ජෝන් පිට්කේන් විසින් බ්‍රිතාන්‍ය සෙබලුන්ට අන දීමත් සමග ම ඒ සියල්ල වෙනස් විය. ලෙක්සිංටන් සටන ලෙස හඳුන්වනු ලබන මෙය, ඇංග්ලෝ-ඇමරිකානු සබඳතාවන්හි එක් සන්ධිස්ථානයක් සනිටුහන් කලේ ය.

සන්නද්ධවීම සඳහා කැඳැවුමක් නිකුත් කල කොංග්‍රසය ජෝර්ජ් වොෂින්ටන් එහි සන්නද්ධ හමුදා භාර කාර්යධරයා ලෙස පත් කලේ ය. අවි අතට ගෙන හුන් නමුදු එය නොතකා තවමත් බොහෝ ඇමරිකානුවෝ, එකඟතාවයකට ඉඩකඩ ශේෂව ඇතැයි සිතුවෝ, ස්වාධීනත්වය පිලිබඳව විවෘත ව කථා නො කලෝ ය. එම අදහස වචනවලට පෙරලා, 1776 ජනවාරියේ ප්‍රකාශයට පත් කෙරුනු සිය *Common Sense* 'සිහි බුද්ධිය' නම් පත්‍රිකාවෙන් ඉදිරිපත් කිරීමට එඩිතර වූයේ පේන් ය.

එහි පලමු සංස්කරනය දෙසතියක් තුල විකිනී අවසන් වී හොර පිටපත් ද පල වෙන්නට විය. එය ඇමරිකාවේ පමනක් නොව මුලු මහත් යුරෝපය පුරා ම මනෝ භාවයන් අවුලුවා ලීමෙහි සමත් විය. මෙහි පිටපත් රුසියාව තුල පවා ප්‍රකාශයට පත් විය.


COMMON SENSE;
ADDRESSED TO THE
INHABITANTS
OF
AMERICA,
On the following interesting
SUBJECTS.

I. Of the Origin and Design of Government in general, with concise Remarks on the English Constitution.

II. Of Monarchy and Hereditary Succession.

III. Thoughts on the present State of American Affairs.

IV. Of the present Ability of America, with some miscellaneous Reflections.

Man knows no Master save creating HEAVEN,
Or those whom choice and common good ordain.
THOMSON.

PHILADELPHIA;
Printed, and Sold, by R. BELL, in Third-Street.
MDCCLXXVI.

සිහි බුද්ධිය

ඇමරිකානු ස්වාධීනත්වය සඳහා කැඳැවුම් කලෝ ඊට ඉහත ද සිටියෝය. පේන් එබන්දක් කල ප්‍රථමයා නො වේ. පේන්ගේ කැඳවුමෙහි වූ වැදගත් කම රැඳී තිබුනේ එය සිදු කල අවස්ථාවෝචිත මොහොත හා ස්වාධීන අමරිකාව කෙබන්දක් විය යුතු ද යන්න පිලිබඳ ඔහුගේ සංකල්පය ද මත ය.

තවමත් අනියතාකාර ව පැවැති අදහසකට සාර්ථක ලෙස හැඩ තල ලබා දීමට ඔහු සමත් විය. හුදෙක් යාන්තමින් මතු වීමට පටන් ගෙන තිබුනු සංකල්පයකට ඔහු දේශපාලන ප්‍රකාශනයක් ලබා දුන්නේ ය. එසේ

කිරීම මගින්, ඔහු මුලු මහත් රට පුරා ද කොංග්‍රසය තුල ද විවාදය සඳහා අනුදේශයන් සැකැසීය.

රාජාන්ඩුවක් පිලිබඳ අදහස ම අවඥාවට භාජනය කල ඔහු දේශපාලන විවාදය තීරනාත්මක ලෙස සමූහාන්ඩුවාදී දිශාවකට හැරවීය. පේන් 'සිහි බුද්ධිය' ලියන තුරු, සමූහාන්ඩු ආකෘතියක ආන්ඩුවක් විශාල පරිමානයකින් පවත්වා ගෙන යාම කල හැකි දෙයකැයි කිසිවෙක් සැබැවින්ම නො සිතුවෝ ය. ඒ වන තෙක් ජනරජයන් සීමා වී තිබුනේ වැනීසිය වැනි නගර - රාජ්‍යයන්ට හෝ වැඩි ම තරමින් ස්විට්සර්ලන්තයේ පලාත් අන්ඩු වලට ය. එහෙත් ආරම්භයේ පටන් ම, තමන් කථා කරන්නේ සමස්ත ජාතිය එ හැම පිටින් වැලඳගන්නා ෆෙඩරල් සමූහාන්ඩුවක් පිලිබඳ ව බැව් පේන් පැහැදිලිව ම දැන සිටියේ ය. මෙය ඊට ඉහත කිසි දා පැවතුනක් නො වී ය. විසි එක් වන සියවසේ අප තවමත් වාසය කරන ලෝකය සැලකිය යුතු පරිමානයකින් පේන් විසින් හැඩ ගස්වන ලදැයි අපට පැවැසිය හැක. මක්නිසා ද යත්, නූතන අන්තර් මහාද්වීපික සමූහාන්ඩුවක අනුදේශයන් ඔස්සේ ඇමරිකාව නුවනින් දැකීමට ඔහු සමත් වූ හෙයිනි.

ඒ වූ කලී සුලුපටු ජයග්‍රහනයක් නො වේ. එහෙත් පේන් එතෙකින් නො නැවතී තවත් දුර ගියේ ය. ඇමරිකානු යටත් විජිත බ්‍රිතාන්‍ය රාජාන්ඩුවට එරෙහිව ගෙන ගිය අරගලය ජාත්‍යන්තර ප්‍රශ්නයක් සේ ඔහු හඳුනා ගත්තේ ය. "ඇමරිකාවේ අභිප්‍රාය මිනිස් වර්ගයාගේ අභිප්‍රාය යැ"යි ඔහු ලිවීය. ඔහු එය, ආසියාවේ හා අප්‍රිකාවේ යටත් විජිත පීඩනයට ද, යුරෝපය තුල රාෂ්ට්‍රීය ප්‍රජා පීඩනයට ද එරෙහි අරගලය සමග අනන්‍ය කලේ ය. ඇමරිකාව, මනුෂ්‍ය වර්ගයාට රක්ෂස්ථානයක් විය යුතුව තිබිනි.

ඉදින් එම පලමු මාස කිහිපය තුල විප්ලවවාදී හමුදා පරාජයට පත් වී නම්, පේන්ගේ අපේක්ෂා පුස්සක් විය හැකිව තිබිනි. හැම අතින්ම පෙනෙන්නට තිබුනේ එසේ සිදු වන බවට ලකුනු ය. මනා පුහුනුවක් නො ලද, මනා ලෙස සන්නද්ධ නොවූ, සෑම පරාජයක් පාසා ම සිතේ දිරිය බල සිඳී කඩා වැටෙමින් හුන් ඔවුන්ගේ තත්ත්වය අවාසිදායක විය. පේන්ගේ ලේඛන, තමන් සටන් කරන්නේ කුමක් සඳහා දැයි හමුදාවට නිශ්චිතව පහදා දෙමින් ඔවුන්ගේ ධෛර්යය තිරසාර කිරීමෙහි ලා අතිශය වැදගත් භූමිකාවක් ඉටු කලේ ය.

'ඇමරිකානු අර්බුදය' නම් පත්‍රිකා මාලාවක් මගින් සාමාන්‍ය සෙබලාගේ දේශපාලන විඥානය ඉහල නැංවීම සඳහා ඔහු දායක වූයේ, පලමු ඉංග්‍රීසි සිවිල් යුද්ධයෙන් පසු ඒ දක්වා කිසි දා නො දැරූ විරූ ආකාරයේ ප්‍රයත්නයක් දරමිනි.

*The American Crisis* 'ඇමරිකානු අර්බුදයේ' මුල් කලාපය, ඉහල පුහුනුවකින් යුත් හෙසියානු කුලී හේවායන්ට මුහුන දීමට සැරසෙමින් ට්‍රෙන්ටනයට රැස් වී හුන් වොෂින්ටනයේ සොල්දාදුවන්ට ඇසෙන්නට කියවන ලදී. ඉනික්බිති ඇමරිකානුවන් ලද ජය විසින් යුද්ධය අවසාන නොකෙරුනු බව සැබෑ ය, එහෙත් බ්‍රිතාන්‍ය බලය යනු මැඩලිය නොහැක්කක් නොවන බව ඉන් සනාථ කෙරින. යුද්ධය තවත් සය වසක් අඛන්ඩව පැවතියේ ය. එහෙත් බ්‍රිතාන්‍යය සමග අරගලය නිදහස සඳහා අරගලයකැයි අර්ථ දක්වා තුබූ පේන් එ මගින් , ඊලඟට මුහුන දීමට සිදුවන යුද්ධය තුල සටන් කල යුත්තේ කවර ආකාරයකින් ද යන්නත් අර්ථ දක්වා තිබුනේය.

එය දේශපාලන සත්ත්වයන් ලෙස හා - සියල්ලටම වඩා - සමානයන් ලෙස තමන් පිලිබඳව සිතූ පුරවැසියනගේ යුද්ධයක් විය යුතු ව තිබිනි. යුරෝපයේ පෞරානික රාජාන්ඩුවලට මේ අදහස් බෙහෙවින් අනතුරුදායක වූයේ ය.

ඇමරිකාවේ විප්ලවවාදී යුද්ධයේ අවසානයත් සමග තම ප්‍රථම ප්‍රේමය වූ විද්‍යාව කරා තාවකාලිකව පෙරලා යාමට පේන්ට හැකි විය. පාලම් ඉදිකිරීමේ, අකුනු සන්නායක සවි කිරීමේ හා ස්වාභාවික ප්‍රපංචයන් විභාග කිරීමේ ව්‍යාපෘතිවලට ඔහු මැදිහත් වූයේ ය. පේන්ට මෙය සිය දේශපාලන ජීවිතයෙන් කවර ආකාරයකින් හෝ වෙන් වීමක් නොවීය. ඔහු විද්‍යාව දුටුවේ, සමෘද්ධිමත් හා සාමකාමී ලෝකයක් නිර්මානය කිරීමේ ශක්‍යතාව සහිත ජගත් ශිෂ්ටාචාරකාරක බලයක් ලෙස ය.

නිව්යෝර්ක් හි පදිංචි වූ ඔහු හාර්ලම් නදිය හරහා පාලමක් ඉදි කිරීමේ යෝජනා ක්‍රමයක් වර්ධනය කිරීම ඇරඹීය. ඔහුට අවශ්‍යතා දෙකක් විය. එ නම්, තාක්ෂනික සහායය හා අනුග්‍රාහකත්වයකි. ඉන් පලමු වැන්න ස්වයං අධ්‍යාපනයක් ලද ඉංග්‍රීසි ජාතිකයෙකු වූ ජෝන් හෝල් වෙතින් ඔහුට ලැබින. හෝල්; බෝල්ටන් හා වොට්, ජෝන් විල්කින්සන්, බැන්ක්ස් ඇන්ඩ් අනියන්ස් සහ රොදර්හැම්හි වෝකර්ස් යන ආයතනවල වැඩ කිරීමෙන් ලද පලපුරුද්ද ඇත්තෙකු විය.

පේන් යකඩ පාලමක් සඳහා සැලසුම් පිලියෙල කිරීම අරඹා එවැන්නක ආකෘතියක් පෙනිසිල්වේනියා රාජ්‍ය ශාලාවේ ප්‍රදර්ශනය කලේ මෙම කාල පරිච්ඡේදයේ දී ය. එහෙත් ඔහුට අවශ්‍ය දෑ සැපයීමට ඇමරිකානු යකඩ කර්මාන්තය සමත් වේ ද යන්න ප්‍රශ්නයක් විය. යකඩ කර්මාන්තය වඩාත් දියුනු අඩියක පැවතුනා වූ ද, විශාල ගස්වල හිඟයක් පැවැත්තා වූ ද යුරෝපය ඔහුගේ යෝජනා ක්‍රමය සඳහා වඩාත් උචිත ස්ථානය විය. 1767 දී සිය ආකෘතිය හා සැලසුම් විද්‍යා ඇකඩමියේ දී ඉදිරිපත් කිරීම සඳහා ඔහු පැරීසිය බලා පිටත් විය. එහි දී එය මහත් උද්යෝගයෙන් පිලිගැනින. එහෙත් ආන්ඩුව බංකොලොත් භාවයට ම පාහේ වැටී තිබූ මේ කාල පරිච්ඡේදය පැරීසියේ පාලම් ඉදිකිරීම්වලට නරක කාලයක් විය. මේ දිනවල ඉදිරිපත් කෙරුනු සෑම යොජනා ක්‍රමය ම නිෂ්පල වූ අතර පේන්ගේ යෝජනා ක්‍රමයට ද හිමි වූයේ එම දසාව ම ය.

"ප්‍රායෝගික යකඩකරුවන්" සොයා ඔහු ආපසු එංගලන්තයට ගියේ ය. වඩාත් ප්‍රායෝගික වූ - නිසැකව ම වඩාත් ම හොඳින් ප්‍රාග්ධනිත වූ - 'යකඩකරුවන්' වූයේ රෙදර්හැම් හි වෝකර්ස් ය. මෙම ආයතනය සැලසුම් පිරික්සා බැලීම සඳහා ලන්ඩනයට සිය නියෝජිතයන් එවී ය. 1788 ඔක්තෝබරය වන විට පේන් මැස්බරෝහි මහා පරිමාන ආකෘතියක් ගොඩ නැගීම සඳහා වැඩට බැස සිටියේ ය. ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ෆ්‍රැන්සිස් ෆොල්ජැම්බ්ගේ නිවෙස

අසලින් ඩොන් නදිය හරහා පාලමක් තැනීමට නියමිත විය. මේ ව්‍යාපෘතිය කිසි දිනක සම්පූර්න නොවීය. එහෙත් පේන්, තවමත් වෝකර්ස් වෙතින් සහාය ලද්දේ, වඩාත් විශාල ව්‍යාපෘතියක් - තේම්ස් නදියේ ඉවුරු යාකරන පාලමක්! - පිලිබඳ ව සිත තබා ගෙන, ඔහුගේ පාලම ලන්ඩනයේ ප්‍රදර්ශනය කිරීමට තීරනය කලේ ය.

පාලම් ඉදිකිරීම, යකඩ තැනීම හා වෝකර් යකඩ සමාගමේ ඉතිහාසය පිලිබඳව මා දන්නා තරමට වඩා වැඩියෙන් දන්නා බොහෝ දෙනෙකු මෙහි සිටින බව මට සහතික ය. එහෙත් මට ඇසීමට අවශ්‍ය ප්‍රශ්නය වන්නේ:

වෝකර් වැනි "ප්‍රායෝගික යකඩකරුවකු", ඒ සා ආසන්න යුගයක දී තම රටේ ආන්ඩුවට එරෙහි ව විප්ලවයකට නායකත්වය දුන් පේන් සමග එකට වැඩ කරමින් සිටියේ ඇයි?

මෙය වටහා ගැනීමට නම් අපි, එම යුගයේ දේශපාලන හා සමාජ සම්බන්ධතාවයන් වටහා ගත යුත්තෙමු. ඇමරිකානු නිදහස් සටන බ්‍රිතාන්‍ය ජන සමාජයේ සියලු තරාතිරම් වල පුලුල් කොටස් අතර අතිශය ජනප්‍රිය භාවයක් අත්පත් කොට ගෙන තිබින. දූෂිත හා මර්දනකාරී එකක් ලෙස තමන් හඳුනා ගෙන සිටි රජයකට එරෙහිව ඇමරිකානු විජිතවාසීන්ගේ අරගලය හා ඔවුහු අනන්‍ය වී හුන් හ. ඔවුන් අතර හුවමාරු වී ඇති ලිපිවලින් පෙනී යන පරිදි, වෝකර් සමඟ දේශපාලනය සම්බන්ධයෙන් නොවලහා සෘජු ලෙස සාකච්ඡා කිරීමට පේන්ට හැකි වී ඇත.

සැල්ෆර්ඩ්හි කම්කරු පන්ති ව්‍යාපාරයේ පුස්තකාලයේ *The Trial of Thomas Paine* තෝමස් පේන් නඩු විභාගය කෘතියේ තෝමස් වෝකර්ට අභිලේඛනය කොට පිලිගැන්වූ පිටපතක් ඇත. එහි වෝකර් විසින් කෙරුනු පහත සටහන දැක්වේ:

"පරමාධිපත්‍යයේ ආධාරකරුවෝ, සමස්ත පර්යාය ම රැවටිල්ලකැයි - අයථා වූත්, සාවද්‍ය වූත්, එකකැයි - යන කරුන පිලිබඳ ව කොතරම් දුරට නෛසර්ගිකව ම දැනුවත් ව සිටින්නාහු ද යත්, ඔවුන් විසින් අධිකරනය ඉදිරියේ විභාගයට ලක් කෙරෙනු ඇත්තේ සාධාරනත්වය යි."

තමන්ගේ යැයි පේන් සතුව තිබුනේ ඩොලර් දහසකට මඳක් වැඩි මුදලකි. එහෙත්, ප්‍රාග්ධන හිමියන් ඔහුගේ ඉංජිනේරු විද්‍යා යෝජනා ක්‍රමයන්ට ආධාර කිරීමට සූදානම්ව සිටි අතර, ඔවුහු ඔහුගේ දේශපාලන පරමාදර්ශයන්ට අනුකූලතාව දැක්වූහ. කර්මාන්තවල ව්‍යාප්තිය සහ වඩාත් සාධාරන දේශපාලන පර්යායක් අන්‍යෝන්‍ය වසයෙන් එකිනෙක වැර ගන්වන බවට වැටහීමක් පැවැතින. එකිනෙකාට වෙනස් සමාජ පසුබිම්වලින් පැමිනි, වෙනස් දෛවයන් උරුම කොට ගෙන හුන් ස්ත්‍රී පුරුෂයන්ට තමන් විග් පාක්ෂික පොදු අරමුනක් තුල එක්සත් වී හිඳින සේ සලකා ගත හැකි විය. එහෙත් නිශ්චිත වැඩපිලිවෙලක් හෝ සංවිධානයක් නොතිබූ එය නූතන අර්ථයෙන් පක්ෂයක් ලෙස ගිනිය හැක්කක් නො වී ය. විග්වරුන් පිලිබිඹු කලේ පුලුල්ව පැතිර ගිය පදනමක දේශපාලන බිහිදැක්මකි.

මාස කිහිපයක කාල පරාසය තුල, පේන් සිය පාලම ලන්ඩනයේ ප්‍රදර්ශනය කරමින් සිටි අතරවාරයේ මේ සියල්ල වෙනස් වී ගියේ ය. 1789 ගිම්හානයේ ප්‍රන්සයේ සිදු වූ සිදුවීම් බ්‍රිතාන්‍යය තුල ක්ෂනික සන්ත්‍රාසයක් ජනනය නො කෙලේ ය. ජූනියේ පොදු ජනයා රජුට ප්‍රතිරෝධය දක්වා නැගී සිටියෝය. ජූලි මාසයේ දී පැරීසියේ ජනයා අවි ආයුධ අල්ලා ගෙන බැස්ටීලය අත් පත් කර ගත්තෝ ය. අගෝස්තුවේ දී ජාතික සභාව ප්‍රවේනි දාස ක්‍රමය අහෝසි කොට, මිනිස් හා පුරවැසි අයිතිවාසිකම් පිලිබඳ ප්‍රකාශනය ඇමරිකානු ආකෘතිය මත පදනම් ව කෙටුම්පත් කිරීම ආරම්භ කලෝ ය. එංගලන්තයේ විග් පාක්ෂිකයෝ මේ වෙනස්කම් සාදරයෙන් පිලිගත්තෝ ය.

ඊලඟ වසරේ වසන්තය වන විට මහජන මතය තියුනු ලෙස ධ්‍රැවාන්ත ගත වී තිබුනේ ය. මෙකී වෙනසෙහි උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කලේ පොතකි. ඒ, එඩ්මන් බර්ක් විසින් රචිත *Reflections on the French Revolution* 'ප්‍රන්ස විප්ලවය පිලිබඳ ප්‍රත්‍යවේක්ෂන' නම් කෘතිය යි. විග් දේශපාලකයෙකු හා දේශපාලන ප්‍රචාරකයෙකු වූ එඩ්මන්ඩ් බර්ක්, පේන්ගේ පෞද්ගලික මිතුරෙක් වූයේ ය. ඔහු සමග නිරතුරුව එකට රාත්‍රී ආහාර ගත් පේන්, වරෙක ප්‍රන්සයට කෙටි චාරිකාවක් ගොස් සිටිය දී බලවත් උද්යෝගයෙන් ඔහුට ලිවී ය. බර්ක් සිය දේශපාලන ජීවිතයේ වඩාත් වැඩි කොටසක් ගෙවා තිබුනේ, අද ව්‍යවහාර වෙන වචන වලින් පැවසුවහොත්, වාමවාදී දේශපාලනයට ය. ඉදින් වයස 60 දී මිය ගියේ නම් ඉතිහාසය ඔහු සිහිපත් කරනු ඇත්තේ කතෝලිකයන්ට හා විරුද්ධ මතධාරීන්ට ඡන්ද බලය ලබා දීමට සහාය දුන්, අයර්ලන්තයට ස්වදේශීය පාලනයක් ලබා දිය යුතු යැයි පැවසූ, වහල් ක්‍රමයට එරෙහි වූ, ඉන්දියාව කොල්ල කෑම පිලිබඳව වොරන් හාස්ටිංස් දෝශාරෝපනයට ලක් කල, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරන වෙනුවෙන් පෙනී සිටි, ආන්ඩුවේ දූෂනයට පහර දුන්, රාජාන්ඩුවේ බලතල පාලනය කිරීමට තැත් කල, සහ ඇමරිකානු විප්ලවයට පිටුබලය දුන් රැඩිකලෙකු ලෙස ය. එහෙත් සිය ජීවිතයේ 61 වන වියෙහි දී ඔහු "ප්‍රන්ස විප්ලවය පිලිබඳ ප්‍රත්‍යවේක්ෂන" ලිවීය. බර්ක්ගේ ප්‍රසිද්ධිය රැඳී පවතින්නේ එම කෘතිය මත ය. එ තුල, විප්ලවයේ ද විබෝධයේ ද විශේෂයෙන් ම සමාජ සමානාත්මතාවයේ ද සියලු මූලධර්මයන් හෙලා දක්නා ලදී. ඔහු සුවිශේෂව ම බිය වූයේ එහි ජාත්‍යන්තරවාදයට ය.

ප්‍රන්සයේ අදහස් බෝ වී බ්‍රිතාන්‍යය තුල පැතිර යාම වැලැක්වීම සඳහා, තමන්ගේ "හොඳම මිතුරන් අතහැර දැමීමටත්, නරක ම සතුරන් සමග එක්වීමටත්" තමන් කටයුතු කරනු ඇතැයි ඔහු කීය. හරියට ම ඔහු කලේ ද එයයි. විග් පක්ෂය දෙකඩ කල ඔහු, දිගටම ප්‍රන්ස විප්ලවයට සහාය දුන් ජීවිත කාලයක මිතුරන්ගෙන් බිඳී වෙන් විය. පේන් ද ඉන් එක් අයෙකු විය.

පෞද්ගලික දබරයක් ලෙස මුල දී පෙනී ගිය දෙය බ්‍රිතාන්‍ය දේශපාලනය යලි පෙලගැස්වූ දේශපාලන සන්ධිස්ථානයක් විය. දහ හත් වන සියවසේ

ස්ටුවර්ට්වරුන් කෙරේ ප්‍රතිරෝධය තුලින් වැඩී ආ විග් පාක්ෂික දේශපාලනය අවසානයකට පැමින ඇති බැව් බර්ක් හඳුනා ගත්තේ ය. ඉංග්‍රීසි සිවිල් යුද්ධයේ පටන් ගත වූ කාලය තුල කර්මාන්ත ශිල්පීන් හා කම්කරුවන් ද, අනෙක් අතට ඉඩම් හිමි රදලයන්, කතිපයාධිපතීන් හා පසු කාලයේ, කර්මාන්ත හිමියන් ද අතර සන්ධානයක් පවත්වා ගෙන යාම කල හැක්කක් ව තිබිනි. දහ අටවන සියවස තුල දී පවා, තමන්ගේ ම දේශපාලන අරමුනු වෙනුවෙන් වූ පාර්ලිමේන්තුවෙන් පරිබාහිර විරෝධතා සඳහා ශ්‍රමික පන්තීන්ගේ ආර්ථික දුක්ගැනැවිලි භාවිත කල හැකි බවට හැඟීමක් විග් පාක්ෂික බලවතුන් අතර තිබින. ප්‍රන්ස විප්ලවය, සහ ඇතැම් විට ඊටත් වඩා මූලික ලෙස, කාර්මික විප්ලවය, එම යුගය නිමාවකට ගෙන ආවේ ය. මක්නිසාදයත්, කාර්මික විප්ලවය විසින් කම්කරු පන්තිය නිර්මානය කෙරුනු අතර නාගරික ජනයාට කල හැකි දේ ප්‍රන්ස විප්ලවය විසින් පෙන්වා දෙනු ලැබූ නිසා ය. දේශපාලන තත්ත්වයේ මෙම වෙනස හඳුනා ගැනීමට සමත් වූ පලමුවැන්නා වීම බර්ක් ගේ විශිෂ්ඨත්වයයි. බර්ක්ගේ ප්‍රත්‍යවේක්ෂන සමඟ අපි, නූතන බ්‍රිතාන්‍යයේ පන්ති දේශපාලනයේ එලිපත්ත මතට පිවිස සිටිමු.

බර්ක් ගේ ජීවිතයේ අවසන් සත් වසර ගත කෙරුනේ බ්‍රිතාන්‍යයේ විදේශ හා ස්වදේශ ප්‍රතිපත්තිය ආපසු හැරවීම සඳහා උද්ඝෝෂනය කිරීමට ය. එහි ලා ඔහු සාර්ථක වූයේ ය. 'කනිෂ්ට' විලියම් පිට් ප්‍රසිද්ධියේ ම බර්ක් හා එක පෙලට හිඳිමින් ප්‍රන්සයට එරෙහිව නිර්දය යුද්ධයක් දියත් කලේ තම රට තුල ප්‍රතිරෝධයක සෑම සංඥාවක් ම සිත් පිත් නැති අයුරින් මර්දනය කර දමමිනි.

සිදුවීම්වල මේ පෙරලිය වඩාත් අපූර්ව එකක් වූයේ ප්‍රතිභාව හා ආලෝකනය ලදවුන් අතර විප්ලවයට අනුකූලතාව නො දැක්වූවෙක් නොවූ - එහි වඩාත් කීර්තිමත් ආධාරකරුවන් අතර කවියන්, විද්‍යාඥයන්, කර්මාන්තකරුවන් හා දේශපාලනඥයන් ද වූ - හෙයින් නොව; බ්‍රිතාන්‍ය පුරාම ප්‍රන්ස විප්ලවයට සහයෝගය පලකරමින් දේශපාලන සංගම් ගොඩනැගූ සාමාන්‍ය මිනිසුන් මහා ජනකායක් ද සිටි නිසා ය. බර්ක්ගේ ප්‍රත්‍යාවේක්ෂන පිටපත් 19,000ක් විකිනෙන විට ඊට පේන් ලියූ පිලිතුර වන මිනිසාගේ අයිතිවාසිකම් කෘතියේ පිටපත් ලක්ෂ දෙකක් විකිනුනේ ය. ඒ හා සම අන් පත්‍රිකාවක් 1640 ගනන්වලින් මොබ දකින්නට ලැබී නොතිබුනි.

බොහෝ ඇමරිකානුවන් තමන් මැග්න කාටයේ (මහා ප්‍රඥප්තිය - 1215) පටන් පැවැත එන ඉපැරනි ව්‍යවස්ථාව යටතේ තහවුරු කොට හා පොදු ව්‍යවහාරික නීතිය තුල නිදහන් කොට ඇති තම අයිතීන් සුරැකීමට සටන් වදින ඉංග්‍රීසින් ලෙස සිතා සිටි හෙයින්, ඇමරිකානු විප්ලවය අතරතුර, බර්ක්ගේ ගතානුගතික මාදිලියේ විග්වාදයට තවමත් ඇමරිකානු විප්ලවයට සහාය දිය හැකිව තිබුනි. නිශ්චිත පුද්ගල කන්ඩායමකට සුවිශේෂී වූ, ඓතිහාසිකව අර්ථදැක්වී තිබුනු දේශපාලන අයිතිවාසිකම් කට්ටලයනක් වෙනුවෙන් බර්ක් පෙනී සිටියේ ය. එහෙත් නිදහස් ප්‍රකාශනය මඟින් ඉදිරිපත් කෙරුනේ මුලුමනින්ම වෙනස් ඉදිරි දර්ශනයකි. - විශ්වීය මිනිස් හිමිකම් - නිදහස, සමානාත්මතාවය සහ සන්තුෂ්ටිය හඹා යාම.

මේ ඉදිරිදර්ශනදෙක එකිනෙකට නොපෑහෙන ඒවා විය. එහෙත් එය වහාම ප්‍රකට වූයේ නැත. බර්ක්ට එය ප්‍රත්‍යක්ෂ වූයේ ප්‍රන්සස විප්ලවයේත්, බ්‍රිතාන්‍යයේ කම්කරු පන්තිය පැනනැඟීමේත් බලපෑම යටතේ ය.

ජැකොබින්වරුන්ගේ ආකාරයේ දේශපාලන සංගම් පිහිටුවා ගත් කම්කරු ජනයා බර්ක්ට පෙනී ගියේ "ඌරන් වැනි අශික්ෂිත සමූහයා" හෝ "අපිරිසිදු මහ ජනයා" ලෙස ය. ඔවුන්ගේ ප්‍රතිචාරය ද එබඳුම එකක් විය. 1792 නොවැම්බරයේ ප්‍රන්ස හමුදාව වල්මි හි දී ලත් ජය සනිටුහන් කරමින් පන්දහසක් කම්කරුවන් ෂෙෆීල්ඩය මුලුල්ලේ පෙලපාලි දක්වන විට ඔවුහු, ඌරෙකු පිට නැඟී බර්ක් දැක්වෙන පඹයෙකු රැගෙන ගියහ. ඡන්ද දායකයන් අතරින් පහෙන් පංගුවක් හා ඡන්ද බලය අහිමි ජනයාගෙන් බහුතරය "නිත්‍ය පරීක්ෂාව යටතේ තැබිය යුතු, සංශෝධනයවීමට මුලුමනින් ම අසමත් ශුද්ධ ජැකොබින් වරුන් වෙතැ" බර්ක් පාර්ලිමේන්තුවට පැවසී ය. ඔහුගේ ප්‍රචාරන මර්දනකාරී පියවර පෙලක් දිගහැරීමේ ආරම්භය විය. පුවත්පත් ද, රැස්වීම් ද, සංවිධාන ද තහනම් කරන ලදී. දේශපාලන ක්‍රියාධරයෝ අත් අඩංගුවට, පිටුවාහලට සහ මරන දඬුවමට පාත්‍ර වූවෝ ය. 1819 අගෝස්තුවේ පීටර්ලූ සංහාරය එහි කුලුගැන්වීම විය. එහි ආධාරයට පැමිනිය හැකිව තුබූ එකම අනෙක් ප්‍රගතිශීලී ජනරජය එසේ කිරීමට අසමත් විය.

ඔහුගේ යුගයේ ප්‍රන්ස දේශපාලන න්‍යායාචාර්ය වරුන් සමඟ සංසන්දනය කිරීමේ දී බර්ක් ඉහල පෙලෙහි ලා නොසැලකේ. ඔහුගේ බුද්ධියට වඩා ඉදිරියෙන් සිටියේ රචනයෙහි ව්‍යක්තභාවයයි. එහෙත් යුරෝපයේ වඩාත්ම ප්‍රතිගාමී තන්ත්‍රයන් විප්ලවවාදී ප්‍රන්සය සමඟ දියත් කල යුද්ධයේ ගෙවුම් නිලධාරියා බිතාන්‍යය වූ හෙයින්, ප්‍රත්‍යාවේක්ෂන කෘතිය ලෝක පරිමාන බලපෑමක් ඇති කලේ ය. ප්‍රන්සය සතුරන් විසින් වට ලනු ලැබ තනිව නැඟී සිටියේ ය. තම නව දේශය, එහි ගතානුගතික කොටස් ප්‍රකෝප කෙරෙන ආකාරයේ යුද්ධයකට පැටලවීම කෙරේ ප්‍රවේශම් සහගත වූ වොෂින්ටන්, ප්‍රන්සයට සහාය දෙන ලෙස ජෙෆර්සන් උපදෙස් දී තිබිය දී ම, එය නොතකා අපක්ෂපාතීව සිටීමට තීරනය කලේ ය. ඒ හෝ මේ කාලය තුල ලෝකයේ බොහෝ කොටස් ඊට පටලවා ගනිමින් ද, ප්‍රන්ස ජනගහනය තුනෙන් පංගුවකින් අඩු කරමින් ද 1798 සිට 1815 දක්වා වූ කෙටි විරාමයක් පමනක් සහිත දිගින් දිගට ඇදී ගිය යුද්ධය නොවන්නට, ඇතැම් තක්සේරුවලට අනුව, විප්ලවයේ ගමන් මග මීට වඩා වෙනස් වීමට ඉඩ තිබින. දීර්ඝ යුද්ධයේ අත්දැකීම් විසින්, ඉතිහාසයේ තුලා තැටිය යුද්ධයෙන් ලාභ ගැරුවන්ගේ ද හමුදාවේ වඩාත් සාර්ථක අන දෙන්නාගේ - එනම්, නැපෝලියන් බොනපාට්ගේ - ද වාසියට දෝලනය කෙරිනි. මේදිනවල දී, විශේෂයෙන් ම 1795 සාගතයකට ආසන්න තතු යටතේ, බ්‍රිතාන්‍ය විප්ලවයට කෙතෙක් ආසන්න ව සිටියේ ද යන්න, සිදුවීම්වලින් පසු පහල වන නුවනින් යුතුව අවතක්සේරු කිරීම පහසු ය. කෙටි ඓතිහාසික

මොහොතක දී, ප්‍රගතිශීලී ධනේශ්වර ජනරජයන් ත්‍රිත්වයක් යුගයේ වඩාත් ම උසස් කාර්මික හා වානිජ සම්පත් එකවර හසුරුවා ලීම පිලිබඳ ඉදිරි දර්ශනය අහසේ ලඹ දෙමින් තිබින. බොහෝ දුරට ම පේන්ගේ දැක්ම වූයේ මෙයයි.

බර්ක්ගේ "ප්‍රත්‍යවේක්ෂන" ප්‍රකාශයට පත් වීමට පෙරාතුව ම පේන් "මිනිසාගේ අයිතිවාසිකම්" ලිවීම ආරම්භ කොට තිබින. එහෙත් "ප්‍රත්‍යවේක්ෂන" පලවීමෙන් ඉක්බිති, මේ වන විට ආපසු එංගලන්තයට පැමින සිටි පේන්, සිය මුල් කටු පිටපත බර්ක්ට පිලිතුරක් වන පරිදි හැඩ ගැස්වීමට පටන් ගති. "මිනිසාගේ අයිතිවාසිකම්"කෘතිය, බහුජන පාඨක සමූහයක් සඳහා දේශපාලන ලේඛනයේ මුලුමනින්ම අලුත් ආකෘතියක් නියෝජනය කරයි. එය බෙහෙවින්ම ව්‍යවහාරික ශෛලියකින් ලියැවී තිබිනි.එය එල්ල කොට තිබුනේ හරියට ම දේශපාලනයෙන් බැහැර කොට තැබීමට බර්ක්ට අවශ්‍ය වූ ජනයා වෙත ය - එනම්, පේන්ගේ ම පසුබිමින් පැමිනි මිනිසුන් වෙත ය - සාමාන්‍ය කාර්මික ශිල්පීන් හා කම්කරු ජනයා. "සිහි බුද්ධිය" සේ ම, එයද ජාත්‍යන්තර වශයෙන් වැඩියෙන් ම අලෙවි වූ පොතක් බවට පත් විය.

කෙසේ වෙතත්, බ්‍රිතාන්‍ය රජය මෙම පොත දෙස හෙලුවේ අඳුරු බැල්මකි. ඔවුහු රාජ්‍ය විරෝධී ලිඛිත අපහාසය සඳහා පේන්ට නඩු පැවරූහ. ඔහුට එරෙහිව එක මිටියට ගොනු වූ ජූරිය පේන් වරදකරු කලේය. මේ වන විට ඔහු සිටියේ ප්‍රන්සයේ ය. එතෙකුදු වුව, තීන්දුවෙන් පසු ඔහුගේ නීතිඥයා උසාවියෙන් එලියට බසින විට රැස්කමින් හුන් ආධාරකරුවෝ සමූහයා ඔහු පිලිගෙන, ලන්ඩනයේ වීථි පුරා ඔහුගේ රිය තල්ලු කර ගෙන ගියහ. සමුද්‍ර සන්ධියෙන් එපිට දී පේන් ම ද වීරයෙකු ලෙස සත්කාර සම්මානයන්ට පාත්‍ර විය. ඔහුට පුරවැසිභාවය පිරිනමන ලද අතර ජාතික සමුලුවේ නියෝජිතයෙකු ලෙස ද පත් කෙරින.

එසේ ඔහු පුරවැසියෙකු බවට පත් වූ රට බලගතු ලෙස තර්ජනයට පාත්‍ර වී තිබුනේ ය. පැරනි රාජාන්ඩුව ප්‍රතිස්ථාපනය කිරීමෙන් මෙන් ම තමන්ගේ ම සුභ සිද්ධිය තව දුරට සලසා ගැනීම ද අරමුන කොට ගත් රදල කුමන්ත්‍රන නිසා ඇතුලතින් ද, ආක්‍රමනකාරී අසල්වාසීන් නිසා පිටතින් ද තර්ජිත ප්‍රන්සය හුදෙකලා විය. එහි ආර්ථිකය හා ව්‍යවහාරික මුදල කඩා වැටෙමින් තිබින. මේ කරුනු විසින් විප්ලවයේ ඉතිහාසය වර්නවත් කෙරින. හදිසි යුදකාලීන පාලනයක් පිහිටුවා ගැනීමටත්, එ මගින් දැඩි ක්‍රියා මාර්ග ගැනීමටත් ප්‍රන්ස විප්ලවවාදීන්ට වඩවඩාත් බල කෙරිනි. මහා භීතිය තුලින් මහා භීෂනය උපත ලදී.

1792 සැප්තැම්බරයේ දී පැරීසිය දක්වා මාර්ග විදේශීය හමුදාවලට විවෘත වූ කල්හි, සැන්ස් කුලට්වරු - පැරිස් ජනයා අතර දුගී ම කොටස් - නගරය රැක ගැනීම සඳහා ලහිලහියේ බැරිකේඩ ඉදි කිරීමට වන්හ. පිටත සතුරන්ගෙන් එසේ ආරක්ෂාව සලසා ගන්නා අතර, නගරය තුල සතුරන්ගෙන් ද ආරක්ෂා විය යුතුව තිබිනි. ඔවුහු වංශවත් සිරකරුවන් මරා දැමීමට පටන් ගත්හ. විප්ලවය රැක ගැනීම සඳහා, ජෙෆර්සන් හැඳින්වූ පරිදි, "ජනතාවගේ හස්තයේ" පිහිට යැදීම අත්‍යවශ්‍ය විය. එය, "බුලට්ටු හා බෝම්බ තරමට අන්ධ නො වූ, එතෙකුදු වුව, යම් තරමකට අන්ධ යන්ත්‍රයකැ"යි ඔහු කීය. එහෙත් විප්ලවයේ ආරක්ෂා සම්බන්ධයෙන් සැන්ස් කුලට්වරුන්ගේ වැදගත්කම වඩවඩාත් ඉහල යන්නට වූ අතර, මේ සමාජ බලවේගයට ප්‍රකාශනයක් ලබා දුන් එකම දේශපාලන කන්ඩායම වූයේ ජැකොබින්වරුන් පමනෙකි. ඉනික්බිති ජැකොබින්වරුන් හා ගිරොන්ඩින්වරුන් අතර ඇවිල ගිය ගැටුම තුල, ගිරොන්ඩින්වරුන් සමග වූ ඔහුගේ කිට්ටු සමාගමය හේතු කොට ගෙන පේන් සැකයට පාත්‍ර ව සිටින බැව් ඔහුට පෙනී ගියේ ය.

සමාජීය ව සැලකූ කල, ජාකොබින්වරුන් හා ගිරොන්ඩින්වරුන් එකිනෙකාගෙන් වෙන් කොට හඳුනා ගත හැකි කිසිවක් නො වූ තරම් ය. ඔවුන් අතර විලක්ෂනය සමනන්විත වූයේ විප්ලවයේ ගමන්මග කෙරේ ඔවුන් දැක්වූ ප්‍රතිචාරවලිනි. 1792 වන විට, ඊට ඉහත කාල පරිච්ඡේදයේ නායකයන් අතර සිටියෝ දැන් අදිමදි කිරීමට ද, ගලා යන සිදුවීම් අවහිර කිරීමේ මං සෙවීමට ද වූ හ. සැන්ස් කුලට්වරුන්ගේ ඉස්මතු වීම ඔවුන් දුටුවේ සියලු දේපල හිමිකම්වලට තර්ජනයක් ලෙස ය. ඔවුන්ගෙන් ඇතැමෙක් විප්ලවයට එරෙහි ව රාජාන්ඩුවාදීන් සමග කුමන්ත්‍රනය කිරීමට සූදානම් ව හුන් හ. පේන් ඔවුන්ගෙන් එකෙකු නො වීය. එහෙත් රජු මරා දැමීමට එරෙහිව ඔහු තර්ක කලේ ය. යම්තාක් දුරකට, විප්ලවය එහි අධිවේගී ගමන්මගේ අතරමඟ දී පේන් අත්හැර දමා ගොස් තිබිනි.

එහෙත් පේන්ගේ ආකල්පය තරමක් සවිස්තරාත්මක ව සොයා බැලීම වටී. 1791 දී වැරීන් කරා පලා යාමට රජ පවුල දැරූ අසාර්ථක ප්‍රයත්නයෙන් පසු ලුවී පහ කල යුතු බවට තර්ක කලවුන්ගෙන් එක් අයෙකු වූයේ පේන් ය. සමූහාන්ඩුවාදය තවමත් පුලුල් ව නො පිලිගැනුනු ඒ කාලයේ, සමූහාන්ඩු සංගමය පිහිටුවා ගත් කුඩා කන්ඩායමට ඔහු ද අයත් විය. 1792 දී, සිය රට එරෙහිව කුමන්ත්‍රනය කිරීම සම්බන්ධයෙන් ලුවීට නඩු පැවරීමට පක්ෂව ඔහු තර්ක කලේ ය. ඊලඟ වසරේ ලුවී මරා දැමීමට ඔහු විපක්ෂ වූයේ අදහස් වෙනස් වීම නිසා නොව, ලුවී ඉවත් කිරීම හුදෙක් ඔහුගේ සහෝදරයන්ට සිහසුනට හිමිකම් කියාපෑමේ අවස්ථාව උදා කර දීමක් පමනක් බැව් වටහා ගත් නිසා ය. නඩු විභාගය සම්බන්ධ ප්‍රශ්නය හා මරන දඬුවම පැමිනවීම යන අවස්ථා දෙකෙහි දී ම, පේන් ප්‍රශ්නය යුරෝපීය සන්දර්භය ක් තුල දැකීමට සමත් විය. නඩු විභාගය විසින් යුරෝපයේ අනෙකුත් කිරුලු පලන් රජවරුන් ප්‍රන්සයට එරෙහිව කුමන්ත්‍රනය කල අයුරු හෙලි කෙරෙනු ඇත. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය රජය යුද්ධයට මුදල් සම්පාදනය කල අයුරු අනාවරනය වනු ඇත. ලුවී සිර ගෙයි තබා ගැනීම මගින් යුද්ධයෙන් පසුව ඔහු පිටුවහල් කිරීම මගින්, ප්‍රන්සයට එරෙහි කුමන්ත්‍රනය ශක්තිමත් වීම වලකා ගත හැකි වෙතැයි ඔහු සිතීය. ලුවී ජීවත් වෙනු ඇත. එහෙත් සාමාන්‍ය පුරවැසියකුගේ තත්වයට පහත් කෙරෙනු ඇත. පැවැති තත්වය පිලිබඳ ඔහුගේ දේශපාලන තක්සේරුව සැලකිල්ලට ගත් කල ඔහුට වැරදී තිබුනා විය හැකිය. එහෙත් ඔහු කිසි කලෙක, සිය සමූහාන්ඩුවාදී මූලධර්මවලින් හෝ රාජාන්ඩු කෙරේ විරුද්ධත්වයෙන් හෝ ඉවත් ව නො ගියේ ය.

1793 ගිම්හානයේ දී ගිරොන්ඩින් නියෝජිතයෝ අත් අඩංගුවට ගනු ලැබූහ. වසර අවසන් වන විට පේන් ම ද සිටියේ සිරගෙයක ය. උන රෝගයෙන් මරනාසන්න තත්වයට පත් ඔහු මරන දඬුවමෙන් ගැලවුනේ අහම්බයෙනි. 1794 (තර්මිඩෝර්) ජූලියේ රොබ්ස්පියර්ගේ ඇද වැටීමත් සමග පේන් නිදහස් කරන ලදී. පසුකලෙක ඇමරිකානු ජනාධිපති පදවියට පත්, එවකට ඇමරිකානු තානාපතිවරයා වූ ජේම්ස් මොන් රෝ, පේන්ගේ සෞඛ්‍යය යථා තත්වයට පත්වන තුරු ඔහු තම නිවෙසට රැගෙන ගියේ ය.

මෙසේ පහතට ඇද වැටී සිටිය දී පවා, පේන්ගේ බුද්ධි ප්‍රභාවෝ ඔහු හැර නොගියෝ ය. ඔහුගේ න්‍යායික අවබෝධය වෙනත් ඕනෑම කාලයක දී තරම් ම තියුනුව හා අභියෝගාත්මකව පැවතින. මේ කාලයේ ලියැවුනු "බුද්ධි යුගය", පේන්ගේ අවසාන උසස්තම කෘතීන් අතර එකකි. එය ප්‍රන්සයේ ඇමරිකා එක්සත් ජනපදයේ, ජර්මනියේ හා බ්‍රිතාන්‍යයේ වැඩිම අලෙවියක් සහිත පොතක් බවට පත් විය. දහනව වන සියවස තුල ආගම හා භෞතිකවාදය අතර පිලිබඳ පිනෝසා වාදී විචාරය පැන නැගීමට ද එය දායක විය. ඔහු සිරගත වීමට සුලු කලෙකට පෙර එහි මුල් කොටස නිම කලේ ය. එය "එක්සත් ජනපදයේ මගේ පුරවැසි සගයන්ට" පිරිනමන පිදුම ලියුවේ ලක්සම්බර්ග් සිරකුටියේ දී ය. දෙවෙනි කොටස ලියන ලද්දේ මොන්රෝගේ නිවසේ රැඳී සුවපත් වෙමින් හුන් අතර තුර ය. එය ඇතැම්විට, අප සතු ස්වයං-චරිතාපදානයකට ඉතාම ආසන්න ලේඛනයයි. ඒ වූ කලී, තර්කයේ මහිමයෙන් විශ්වයේ ව්‍යූහය වටහා ගැනීමට මිනිසාට ඇති හැකියාවත්, විද්‍යාවත් කෙරේ රැඳි විශ්වාසය පිලිබඳ පෞද්ගලික සාක්ෂ්‍යයකි.

"යුදෙව් පල්ලිය, රෝමානු පල්ලිය, ග්‍රීක පල්ලිය, තුර්කි පල්ලිය, ප්‍රොතෙස්තන්ත පල්ලිය හෝ වෙනත් මා දන්නා මොන යම් පල්ලියක් විසින් හෝ දේශනා කරනු ලබන ඇදහිල්ලක් මම විශ්වාස නො කරමැයි"යි ඔහු ලිවීය. "මගේ පල්ලිය වනුයේ මගේම මනසයි." තරුනයෙකු ලෙස තමන් විද්‍යාව කෙරේ ආකර්ෂනය වූ අයුරු සිහිපත් කරන ඔහු, තව දුරටත් පවසන්නේඃ "දේශපාලනය ලෙස හඳුන්වනු ලබන දේ පිලිබඳව කිසිදු නැඹුරුවක් තම සිතෙහි නොවූ බවයි. " ප්‍රයෝගකාරීත්වය යන වචනයේ ගැබ්ව ඇති අදහසට වඩා වැඩි යමක් ඉන් මගේ සිතට නොහැඟේ. එහෙයින් මා මගේ සිතුවිලි රාජ්‍ය පාලනය හා බැඳුනු කටයුතු කෙරේ යොමු කල කල්හිමා උගෙන තුබූ සදාචාරාත්මක හා දාර්ශනික මූලධර්මයන්ට ගැලපෙන යම් පර්යායක් මා වෙනුවෙන් නිර්මානය කර ගත යුතුව තිබිනි."

තමාගේ ම ජීවිතය පිලිබඳ ඓතිහාසික තක්සේරුවක් කරන ඔහු එමගින් තමන්ගේ ම දායකත්වය ලෝක පරිමාන සන්දර්භයක තබයි.

ඇමරිකාවේ සිදුවීම්වලින්, අති දැවැන්ත ජවනිකාවක් ලෝකයට තමා ම විවර වී ගන්නා අයුරු මම දිටිමි, නැතහොත් මා දුට බැව් මම සිතීමි. ඇමරිකානුවන් එංගලන්ත රජය සම්බන්ධයෙන් ඔවුන් අනුගමනය කරමින් සිටි සැලසුම් වෙනස් කොට ස්වාධීනත්වය ප්‍රකාශ නොකලෝ නම්, සිය උපක්‍රම මගින් ඔවුන් අනේකවිධ නව දුෂ්කරතාවන්හි පැටලී ගනු පමනක් නොව, මනුෂ්‍ය වර්ගයා අභියස ඉදිරිපත් වී තිබූ භව්‍යතාවයන් ද වසා දමන බ වමට පෙනී ගියේ ය. "සිහි බුද්ධිය" ලෙසින් හැඳින්වෙන කෘතිය මා පල කලේ මෙම ආධ්‍යාසය මත ය. එය මා විසින් පල කෙරුනු මුල් ම කෘතිය වූ අතර, මා ගැන මට විනිශ්චය කල හැකිතාක් දුරට මට කිව හැක්කේ , ඇමරිකාවේ සිදුවීම් නොවන්නට ලෝකය කිසි කලෙක කවර හෝ විෂයයක් පිලිබඳව ලියූ ලේකඛකයෙකු ලෙස මා නොදකිනු ඇති බවයි. මා "සිහි බුද්ධිය"1775 වසරේ අවසාන භාගයේ ලියූ අතර 1776 ජනවාරි පලමුවන දා එය ප්‍රකාශයට පත් විය. ඊලඟට එලැඹි ජූලි 4 වන දින නිදහස ප්‍රකාශ කරන ලදී.

තමන් බොහෝ විට සිය මරනයට මුහුන දී සිටිනු විය හැකි බව දැන දැන ම, ක්‍රිස්තියානි ආගම සමග සමථයකට එලැඹීම ඔහු ප්‍රතික්ෂේප කරයිඃ

ඔහු මෙසේ ලියයිඃ "සිතෙහි අදහසක් ඇති කර ගැනීමට සහ එම අදහස මත ප්‍රත්‍යවේක්ෂනයන් ක්‍රියාත්මක වීමට හැකි වූ කාලයේ සිට ම; ක්‍රිස්තියානි පද්ධතියේ සත්‍යතාව පිලිබඳ එක්කෝ සැකයක්, නැතහොත් එය අමුතු කටයුත්තතකැයි සිතුවිල්ලක් මා තුල විය - එය ඒ දෙකින් කුමක්දැයි මම හරි හැටි නො දැන සිටියෙමි. එහෙත් මට වයස අවුරුදු හතක් හෝ අටක් පමන කාලයේ, පල්ලියේ උග්‍ර ශ්‍රද්ධාවන්තයෙකු වූ මගේ ඥාතියෙකු විසින්, දෙවියන් වහන්සේගේ පුත්‍රයාගේ මරනය මගින් මෝක්ෂය ලැබීම යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද යන මැයෙන් කියවන ලද අනුශාසනයක් අසා සිටියෙමි. අවසානයේ මම උද්‍යානයට ගියෙමි. උද්‍යානයේ පඩිපෙල බසින අතර - මේ ස්ථානය මට හරියටම මතකය - මා ඇසූ දේ සිහිවන විට මට දැනුනේ අපුලකි. එය, සර්ව බලධාරී දෙවියන්, තමාගෙන් ම පලි ගත නො හැකි වූ කල සිය පුත්‍රයා මරා දැමූ ලාලසී පුරුෂයකු මෙන් හැසිරීමට සැලැස්වීමකැයි මම තනිව සිතීමි. මිනිසකු මෙවැන්නක් කලේ නම් ඔහු එල්ලා දමනු ඇති බවට මට කිසිත් සැකයක් නොවූයෙන්, ඔවුන් එවැනි අනුශාසනා පැවැත්වීමේ අරමුන කවරාකාර එකක්දැයි මට සිතා ගත නොහැකි විය. මේ සිතුවිලි තුල බොලඳ නොසැලකිලිමත් භාවයක සේයාවක් හෝ ගැබ්ව නොතිබූ අතර, මට එය, දෙවියන් එවැන්නක් කිරීමට හොඳ වැඩි බවටත් එවැන්නක් කිරීම අත්‍යවශ්‍ය නො වනු ඇති තරමට සර්වබලධාරී බවටත් මා තුල වූ අදහසින් පැන නැගුනු බැරෑරුම් ප්‍රත්‍යවේක්ෂනයක් විය. මේ මොහොතේ දී ද මා විශ්වාස කරන්නේ එ සේ ම ය. තව ද, දරුවෙකුගේ මනස කම්පනය කෙරෙන යමක් සහිත ඕනෑම ආගමික පද්ධතියක් සැබෑ එකක් විය නොහැකි බව ද මම වැඩි දුරටත් විශ්වාස කරමි."

රොබ්ස්පියර්ගේ ඇද වැටීමෙන් පසුව වුව, පේන් කිසිසේත් සුරක්ෂිත වූයේ නැත. අලුත් සහ වඩාත් බැරෑරුම් යැයි සිතිය හැකි අනතුරක් ඉස්මතු විය. විප්ලවය ප්‍රතිගාමී දිශාවකට ගමන් කරමින් තිබුනේ ය.

1799 දී බොනපාට් බලයට නැංවූ 18 වන බෲමරයේ හමුදා කුමන්ත්‍රනය සමග පේන් යලිත් සැකයට පාත්‍ර වී සිටියේ ය. විප්ලවය අහවර වී ඇතැයි නැපෝලියන් නිවේදනය කලේ ය. 1802 වන විට යලි ඇමරිකාවට ගොස් සිටි පේන් සත් වසරක ඇවෑමෙන් එහිදී මිය ගියේ ය.

අප පේන්ගේ වෘත්තීය ජීවිතය තක්සේරු කරන්නේ කෙසේ ද?

ඔහුගේ වෘත්තීය ජීවිතය අසාර්ථක එකක් ලෙස දැකිය හැකි ය. බ්‍රිතාන්‍ය නාවුක හමුදාව සඳහා කාලතුවක්කු තැනීම මගින් වෝකර්ස් සමාගම පොහොසත් විය. වික්ටරි නම් වූ නෙල්සන්ගේ පතාක නෞකාවේ තිබූ කාල තුවක්කුවලින් අසූවක් ම වෝකර්ස් හි තන ලද ඒවා විය. පිට්ටනි කරා ඇවිද




පේන්ගේ සොහොන්ගැබ නිව් රොෂෙල්, නිව් යෝර්ක්

ගොස් වෝකර් සමාගමේ කාල-තුවක්කුවල අත්හදා බැලීමේ වෙඩි මුර බැලීම එදා සුලබ සවාරියක් විය. පේන් මහා ධනයක් හරිහම්බ කලේ නැත. පාලම් තනන්නෙකු වශයෙන් ලැබීමට ඉඩ තිබූ සෞභාග්‍යය ද ඔහුගෙන් ගිලිහී ගියේ ය. ඔහුගේ පොත්වලින් ඔහු ලැබූ දෙයක් නැති තරම් ය. ඉන් ඉපැයූ මුදල් විප්ලවවාදී අභිප්‍රායයන් වෙනුවෙන් පරිත්‍යාග කරන ලදී.

දේශපාලන වශයෙන් පවා ඔහු ලද ජයග්‍රහන අඳුරු කර දමනු ලැබූ බව පෙනී යයි. ඔහු සිය මරන මංචකයේ වැතිර සිටිය දී, ඔහුගේ දේවවාදය (තර්ක බුද්ධිය, නිරීක්ෂනය, හා මිනිසාට බුද්ධිගෝචර වන මැවුම්වාදයක් මත පදනම් වූ හා පල්ලිය ප්‍රතික්ෂේප කල පේන්ගේ දේවවාදය -ප.) අත්හැරීමට බල කරමින් ක්‍රිස්තියානි දේවගැතිවරු ඔහුට හිරිහැර කලෝය. ඔහු මිය යන විට බ්‍රිතාන්‍යය, ප්‍රන්සය හා ඇමරිකාව තුල ඔහු ගර්හාවට පාත්‍රවිය. ඔහුගේ දීර්ඝකාලීන මිත්‍රයා වූ ජෙෆර්සන්ට පවා, තෝමස් පේන්ගේ නාමය සමග ප්‍රසිද්ධියේ ඈඳීම පිලිබඳව ප්‍රවේශම් වන්නට සිදු වී තිබිනි.

එහෙත් යථාර්ථය සැලකුකල පේන් ලද ජයග්‍රහන, ඔහුගේ වඩාත් සාර්ථක සේ පෙනී යන සමකාලීනයන්ට වඩා සැලකිය යතු තරම් වැඩි ඒවා බැව් පෙනී යයි. පේන්ගේ සාර්ථකත්වය රැඳී පැවතියේ නූතන සමූහාන්ඩු දෙකක් බිහි කිරීමෙහි ලා ඔහු ඉටු කල කාර්ය භාරය තුල ය. දේශපාලනය වටහා ගැනුනු හා සිදු කෙරුනු ආකාරය ඔහු වෙනස් කලේ ය. පේන්ට පෙර, දේශපාලනය වරප්‍රසාද ලද්දන් සඳහා වෙන් කොට සුරැකි දෙයක් විය; පේන්ගෙන් ඉක්බිති මහා ජනතාවෝ තමන්ට හඬක් සොයා ගැනීමට ද, දේශපාලන පීඨිකාව මත රංග ධරයන් වීමට ද පටන් ගත්හ.

ඊලඟ මහා විප්ලවවාදී නැගිටීම - ඇමරිකානු සිවිල් යුද සමය - තුල පේන්ගේ කීර්තිය යලි පන ලැබීම ඇරඹුනි. ඔහු චාටිස් ව්‍යාපාරයේ දේශපාලන උපදේශක වරුන්ගෙන් එක අයෙක ද විය. සමාජ සමානාත්මතාවය දේශපාලන වැඩ පිලිවෙලට යලි ඇතුලත් කෙරුනු කොයි කවර අවස්ථාවේ වුව, ඔහු පිලිබඳ මතකය ගෞරව බහුමානයෙන් යුතුව සිහිපත් කෙරිනි.

ඔහුගේ අසාර්ථකත්වයන් සේ පෙනී යන දේ, තමන් ජීවත් වූ කාලයේ ශක්‍යතාවයන් අභිබවා ඉදිරියෙන් සිටින අභිලාෂයන්ගෙන් යුතු වූවකු ලැබූ අසාර්ථකත්වයෝ වෙති. සියල්ලන්ට ම සෞභාග්‍යය සහතික කරනු වස් ඉහල ම ඵලදායීත්වයෙන් යුත් තාක්ෂනික ක්‍රමවේදයන් උපයෝගී කර ගැනෙන, සමාජ සමානතාවය මත පදනම් වූ සාමකාමී ලෝක ශිෂ්ඨාචාරයක් පිලිබඳ ඔහුගේ දැක්ම එදා සාක්ෂාත් කර ගත හැක්කක් නො වී ය. එසේ වුව, එය ප්‍රයත්නයක් දැරීමට වටනා දෙයක් නොවන්නේ ද? අසාර්ථකත්වයන් නො ව මේවා තවමත් සපුරා ගත නො හැකි වූ පේන්ගේ ජීවිතයේ අරමුනු වේ. අවසාන වශයෙන් අපට නිගමනය කිරීමට සිදු වනු ඇත්තේ, මහා නිෂ්පාදකයන් විසින් නූතන ලෝකය නිර්නය කෙරුනාට ද වඩා වැඩි කල් පවත්නා නිර්නයක් පේන් ඊට ලබා දී ඇති බවයි. එ පමනක් නො ව, අප තවමත් ජීවත් වන්නේ, බොහෝ ආකාරයන්ගෙන් පේන්ගේ යුගය ලෙස හඳුන්වා දිය හැකි යුගයක බවයි.

©www.wsws.org